www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ටෙඩ් ග්‍රාන්ට් - බ්‍රිතාන්‍ය මිලිටන්ට් ප්‍රවනතාවයේ හිටපු නායකයා පිලිබඳ දේශපාලන ඇගයීමක්

## පලමුවන කොටස

**Ted Grant: A political appraisal of the former leader of the British Militant Tendency -- Part 1**

**ඈන් ටැල්බට් විසිනි**

**2006 සැප්තැම්බර් 27**

පසු ගිය ජුලි මාසයේ අවුරුදු 93 දී මිය ගිය මිලිටන්ට් ප්‍රවනතාවයේ ප්‍රාරම්භකයා වූ, ටෙඩ් ග්‍රාන්ට් හට ලියොන් ට්‍රොට්ස්කිගේ අදහස්වල ජීවිතකාලීන යෝජකයකු ලෙස සිය ආචාරය පුද කිරීමට විරුද්ධවාදීහු මෙන්ම ආධාරකරුවෝ ද එකාවන්ව පෙරමුන ගත්තෝ ය. "පැරනි පාසලේ නැවත ගොඩනගාගත නොහුනු ට්‍රොට්ස්කිවාදී විප්ලවවාදියෙකු" ලෙස ටයිම්ස් පුවත්පත ඔහු ගැන ප්‍රකාශ කලේ ය. ෆිනෑන්ෂල් ටයිම්ස් පුවත්පත ඔහුගේ මරනය ප්‍රකාශයට පත් කලේ "70 අවුරුද්දකට වැඩි වූ ප්‍රමුඛ ට්‍රොට්ස්කිවාදියෙක්" ලෙස ය. මෙම ප්‍රකාශ ඔහු පිලිබඳ ග්‍රාන්ට්ගේ ම මතය සමග හොඳින් ගැලපුනි.

ඔහුගේ මරනයට සතියකට පෙරාතුව, ජාත්‍යන්තර මාක්ස්වාදී ප්‍රවනතාවයේ රැස්වීමක දී, ඒ වනවිටත් හදිසි ආබාධයක් නිසා දුබලත්වයකින් පෙලුන, ග්‍රාන්ට්, උදව් ඇතිව මයික්‍රෆෝනය වෙත කැඳවාගෙන යනු ලැබින. තමන් ට්‍රොට්ස්කිගේ අදහස් මත නිරතුරුව පදනම් වූ බව එහි දී ඔහු ප්‍රකාශ කලේ ය. එය යමෙකුගේ කායික සවිබලය හා ඔහුගේ එක සිතින් කල දේශපාලන කැපවීම යන දෙකට ම සාක්ෂි දරීමක් සේ ම මරනය ආසන්නයේ සිටින්නෙකුගේ අපූර්ව ක්‍රියාකාරිත්වයක් ද විය. සෝවියට් සංගමයේ දී උත්කර්ශයට පත්වුන, දේශපාලන බලය පැහැරගත් නිලධාරිවාදයට එරෙහි වුන, ට්‍රොට්ස්කිගේ අරගලය සම්බන්ධව දේශපාලනිකව දැනුවත් වුන පරපුරේ නොනැසී සිටි නියෝජිතයන් ගෙන් එක් අයෙක් ග්‍රාන්ට් විය.

1917න් පසු දශකවල දී, රුසියානු විප්ලවය මොඩලයක් සහ මිනිස් වර්ගයාගේ අනාගතය සඳහා වූ ආවේශයක් ලෙසට දුටු තරුන ජනයා අතුරින්, විසිවන සියවසේ දී අත්විඳි කම්පන හා බලවත් කැලඹීම් යටතේ, තමන්ගේ ජීවිත පුරාවට ම විප්ලවවාදී දේශපාලන මූලධර්ම සඳහා කැපවීමක් දක්වීමට හැකි වූයේ ටිකදෙනෙකුට පමනි. මාක්ස්වාදයේ හා බොල්ශෙවික්වාදයේ විප්ලවවාදී සම්ප්‍රදායේ අඛන්ඩ බව ට්‍රොට්ස්කි විසින් නියෝජනය කල බව පිලිගන්නා සියලු ම දෙනා අපගේ ගෞරවය දිනා ගැනීමට සුදුස්සෝ වෙති. නමුත්, විප්ලවය සඳහා කල ඔවුන්ගේ තාරුන්‍ය කැප කිරීම සඳහා, අපගේ ඉමහත් ආචාරය පුද කල හැකි වන්නේ ඔවුන්ගේ පසු කාලීන දේශපාලන චර්යාව වෛෂයික හා දේශපාලනික විශ්ලේෂනයකට භාජන කල විටකදී පමන ය.

ට්‍රොට්ස්කිවාදියා යන වදනින් අප තේරුම් ගන්නේ, 1917 ඔක්තෝබර් රුසියානු විප්ලවයේ ප්‍රකාශ කෙරුනු සමාජවාදී ජාත්‍යන්තරවාදයේ මූලධර්ම ආරක්ෂා කරන විප්ලවවාදී මාක්ස්වාදියෙකු යන්න නම්, ග්‍රාන්ට් ඔහු මිය යන විටවත්, ජීවත්වූ බොහෝ කාලයකටවත් ට්‍රොට්ස්කිවාදියෙකු නොවූ බව මුලදී ම කිව යුතු ය. ජීවිත කාලය පුරාවට ම බොහෝ සේ ප්‍රර්ථනා කල ගුනවාචකය වයස්ගත වූ පුද්ගලයෙකුගේ මරනයකදී ප්‍රතික්ෂේප කිරීම අශිෂ්ඨ ලෙස පෙනෙන නමුදු ග්‍රාන්ට්ගේ දේශපාලනය හුදු පුද්ගලික කාරනාවක් නො වේ. එය, නිලධාරිවාදී උපකරනය කම්කරු පන්තිය මත ආධිපත්‍යය දරූ, බොහෝ දෙනා බොහෝ දුරට කම්කරු පන්තියේ නීත්‍යානුකුල නායකත්වය ලෙසට නිලධාරිවාදී උපකරනය හඳුනා ගත් වකවානුවක ගතිලක්ෂන විය.

විප්ලවවාදී සමාජවාදී ලීගය නමින් පුද්ගලිකව ද මිලිටන්ට් ප්‍රවනතාවය නමින් ප්‍රසිද්ධියේ ද බ්‍රිතාන්‍යයේ දී ග්‍රාන්ට් විසින් නායකත්වය දුන් ව්‍යාපාරය, ලේබර් පක්ෂයේ ප්‍රතිසංස්කරනවාදී දෘෂ්ටිය ලෙසට තරුන ජනතාව පුහුනු කලේ ය. විප්ලවවාදී සමාජවාදය පිලිබඳ මිලිටන්ට් ප්‍රවනතාවයේ හිමිකම් සැමවිට ම කතා හා ඓතිහාසික ලිපි ලේඛනවලට සීමා විය. සැලසුම් සහගත හා මහජන පාලනයෙන් යුතු ආර්ථිකයක පදනම ලෙසට, ලේබර් ආන්ඩුව මගින් පාර්ලිමේන්තුවේ දී සම්මත කරවා ගන්නා පනතක් මගින් ප්‍රධානතම ඒකාධිකාරී සමාගම් 200ක් පමන ජනසතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙසට සමාජවාදය පැන නැගිය හැකි බව මෙම දෘෂ්ටිය සපථ කලේ ය. බ්‍රිතාන්‍ය කම්කරු පන්තිය ස්වයංසිද්ධ විරෝධතා ව්‍යාපාරවලට හැමවිටම අනුගත කල උපායාත්මක අවස්ථාවාදයක ලක්ෂන මිලිටන්ට්

ව්‍යාපාරය තුල විය. එපමනක් නොව, එම ව්‍යාපාර, ලේබර් පක්ෂයේ සහ වෘත්තීය සමිතිවල, නිල කම්කරු ව්‍යාපාරයේ සීමාවන් තුල ආරක්ෂාකාරීව තැබී ය.

ලේබර් පක්ෂය විසින් පාලනය කරන ලද ලිවර්පූල් නගර සභාව 1980 දී මිලිටන්ට් ව්‍යාපාරයේ ආධිපත්‍යයට නතු වන විට සිදු වූයේ මෙය යි. එය කුප්‍රකට ලෙස කොන්සවේටිව් ආන්ඩුව සමග ඇති කර ගත් අවස්ථාවාදී ගනුදෙනුව නිසා ප්‍රාදේශීය සේවාවන් මත එල්ලවන ප්‍රහාරයන්වලට එරෙහිව ලිවර්පූල් නගර සභා සේවකයන් දියත් කල අරගලය විනාශ කිරීමටත් නීල් කිනොක්ගේ නායකත්වයෙන් වෘත්තීය සමිති කොන්ග්‍රසය සහ ලේබර් පක්ෂය විසින් මෙහෙයවුන 1984-1985 පතල් කම්කරුවන්ගේ වැඩ වර්ජනය හුදකලා කිරීමටත් උදව් වුනේ ය. මේ අයුරින්, මැත දශක තුල බ්‍රිතාන්‍ය කම්කරු පන්තිය පෙලූ වඩා දරුනුතම ප්‍රහාරවලින් එකකට ග්‍රාන්ට් ආධාර කලේ ය.

1990 දශකයේ මුල් කාලයේදී (poll tax) ඇඟ බද්දට එරෙහි ව්‍යාපාරයේ දීත්, මිලිටන්ට් ව්‍යාපාරයේ බිඳීමකින් ස්කොට් සමාජවාදී පක්ෂය ඇතිවීම ප්‍රතිඵලයක් වුන ස්කොට් බෙදුම්වාදීන් හට සහයෝගය දීමේදීත්, ව්‍යාපාරය විසින් සිදු කරනු ලැබුවේ තද බල පන්ති ගැටුමක් පැන නැගුනු කාලයක දී, බොහෝ තරුන ජනයාගේ සහ කම්කරුවන්ගේ විප්ලවවාදී අභිලාෂයන් ප්‍රතිසංස්කරනවාදී මාර්ග වෙත හරවා යැවීම යි.

1980 දශකයේ දී, බ්‍රිතාන්‍යයේ පැවතුන විශාලතම ට්‍රොට්ස්කිවාදී පක්ෂය ලෙස මිලිටන්ට් තමන්ව ප්‍රකාශයට පත් කර ගත්තේ ය. මෙම කාලය ග්‍රාන්ට්ගේ මහා ජනතා ජයග්‍රහනය වූ නමුදු එය ම ඔහුගේ විනාශයේ පූර්විකාව බව ඔප්පු කලේ ය. මිලිටන්ට් වෙත බැඳුනු තරුන ජනයා, විරැකියාව, මහජන සේවා කපා හැරීම් හා අධිරාජ්‍යවාදී යුද්ධය වෙත හැරීම් වැනි ගති ලක්ෂනවලින් යුක්තවූ තැචර් ආන්ඩුවෙන් ලද අත්දැකීම් මත රැඩිකල් අදහස් දරූවන් වූහ. ඔවුනට මිලිටන්ට් හමුවූයේ කම්කරු පක්ෂය වෙත හැරීමේදී වුවත් මෙම තරුන කම්කරුවන්ගේ දේශපාලන ගමන් පථය වමට හැරවෙන අතරේ ග්‍රාන්ට් ව්‍යාපාරය දකුනට පැද්දේ ය. ඔවුහු හමු වූයේ ප්‍රතිවිරුද්ධ දිශාවන්ට ගමන් කරන අතරතුරේ දී ය.

ග්‍රාන්ට්ගේ වැනි වූ දේශපාලනයේ වෛෂයික මූලයන් ජාත්‍යන්තර දේශපාලන තත්වයන්ගේ ගතිකයන් මගින් යටපත් කරමින් පැවතුන නිසා ඔහුගේ වාගාලංකාරය මෙම තරුනයන් කම්කරු පක්ෂය තුල තබා ගැනීමට අපහසු විය. ප්‍රතිසංස්කරනවාදී වැඩ පිලිවෙල සහ සුබසාධන වැඩ පිලිවෙල ඉදිරිපත් කිරීමට ලේබර් පක්ෂයට තිබූ හැකියාව ශීඝ්‍රයෙන් අවසානය කරා යමින් තිබුනි. බොහෝ නිලධාරිවාදී උපකරනයන්ට මොඩලයක් හා ආවේශයක් සැපයූ සෝවියට් සංගමයේ ස්ටැලින්වාදී නිලධරය නැවත ගොඩ ඒමට නොහැකි ලෙස අර්බුදයට ලඟාවෙමින් සිටියේ ය.

දෙවන ලෝක යුද්ධයෙන් පසු ග්‍රාන්ට්ගේ සම්පූර්න දේශපාලන ඉදිරිදර්ශනය රඳා පැවතුනේ, ක්‍රෙම්ලින් නිලධරය, බටහිර රටවල්වල සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ හා වෘත්තීය සමිති සහ පැරනි යටත් විජිත හා අර්ධ-යටත්විජිත රාජ්‍යවල ජාතික ව්‍යාපාරයන් සිය දේශපාලන ආධිපත්‍යය රඳා පවත්වා ගැනීමට සමත්වේ ය යන උපකල්පනය මත ය. නමුත් 1992 වන විට, මිලිටන්ට් වෙතින් ඔහුව නෙරපා දමෙන විට දේශපාලන භූ-දර්ශනයේ ස්ථිර ලක්ෂන ලෙසට ග්‍රාන්ට් සලකා තිබූ දෑ 1917 වැනි වූ විප්ලවීය කැලඹීමක් වලක්වන්නට දෙවන ලෝක යුද්ධයෙන් පසු ප්‍රධාන බලවේග විසින් සූදානම් කෙරුනු සාපේක්ෂ ක්ෂනික නිෂ්පාදන බවට ඔප්පු වී තිබුනි.

ඇලන් වුඩ්ස් සමගින් ග්‍රාන්ට්, එහි ලියවිල්ලේ නම ලෙසින්ම සෝෂලිස්ට් ඇපීල් (සමාජවාදී ආයාචනය) නමින් වෙනත් කන්ඩායමක් පිහිටුවා ගත් අතර පීටර් ටාෆ් විසින් මෙහෙයවනු ලැබූ වැඩි කොටස "මිලිටන්ට් ලේබර්" නම් සංවිධානයක් පිහිටුවී ය. එය පසුකාලීනව සමාජවාදී පක්ෂය බවට පත් විය. ග්‍රාන්ට්ගේ මාක්ස්වාදී ප්‍රවනතාවය වැනිසියුලානු ජනාධිපති හියුගෝ චාවේස් වැන්නන්ට හුරේ දමන්නා වූ සංවිධානයන් අතුරින් ප්‍රමුඛතම එකක් විය. එය ඔහුව ඉදිරිපත් කරන්නේ බලවත් ඇමරිකාව සමග අරගල කරන්නට බිය නැති විප්ලවවාදී නායකයකු ලෙසත් වැනිසියුලානු සමාජය සමාජවාදී දිශාවට පරිවර්තනය කරන්නනට කටයුතු කරන බලවන්තයකු ලෙසත් ය.

වැනිසියුලානු රාජ්‍යයේ අධිකාරිවාදී උපකරන එම ස්ථානවල ම පැවතියත් බහුජාතික සමාගම් තව දුරටත් එහි ලාභ උපයන්නේ වුවත් ග්‍රාන්ට්ගේ ආධාරකරුවන් පවසන්නේ ධනපති පන්තිය තව දුරටත් එහි බලය පතුරුවන්නේ නැති බවයි. මෙසේ කිරීමෙන්, බ්‍රිතාන්‍ය කම්කරු පන්තිය අත්විඳි පරාජයට වඩා වැඩි දැවැන්ත පරිමානයක පරාජයකට ඔවුහු මාර්ගය හෙලිපෙහෙලි කරති. ලතින් ඇමරිකාවේදී ලද අත්දැකීම් පෙන්නුම් කරනුයේ, පවතින රාජ්‍ය උපකරන විනාශ නොකර, ධනවාදය නොඉඳුල්ව ඉතිරි කරමින්, බලය ලබාගන්නා වාමාංශික ව්‍යාපාර, පිනෝචේ විසින් චිලියේදී ක්‍රියාත්මක කලා මෙන් ලේ වැකි යටත් කිරීමකට පූර්විකාව සපයන බවයි.[1]

මාක්ස්වාදියෙක් හා ලියොන් ට්‍රොට්ස්කිගේ අදහස්වල ජීවිතකාලීන යෝජකයෙක් ලෙස ග්‍රාන්ට්ගේ ප්‍රසිද්ධිය, වැඩ කරන ජනයා හා තරුන ජනයා අතරේ සහයෝගය දිනාගන්නට මෙම ව්‍යාපාරවලට හැකියාවක් ලැබීමට වැදගත් පිටිවහලක් දිගට ම සපයයි. ඔහු මූලික මාක්ස්වාදී චින්තකයෙක් වූ බවත් ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ප්‍රධාන දේශපාලන චරිතයක් වූ බවත් පවසමින් ඔහුගේ ආධාරකරුවෝ අනලස්ව ප්‍රතිරූපය වර්ධනය කරති. ග්‍රාන්ට් කන්ඩායමේ පුවත්පත වන සෝෂලිස්ට් ඇපීල් දියත්කිරීමට වසරක් සැපිරීම

නිමිත්තෙන් ඇලන් වුඩ්ස් මෙසේ සඳහන් කලේ ය. " සහෝදර ටෙඩ් ග්‍රාන්ට් පුද්ගලයා තුලින් අපි ට්‍රොට්ස්කිගේ අදහස්වල අවිච්ඡේදය සඳහා පෙනී සිටිමු. ලියොන් ට්‍රොට්ස්කි හා වාමාංශික විරුද්ධ පාර්ශ්වය රුසියානු කොමියුනිස්ට් පක්ෂයෙන් නෙරපා හැරීමේ 75වන සංවත්සරය මේ වසරේ යෙදී ඇත. මුල් කාලයේ සිට ම ග්‍රාන්ට් සහෝදරයා ට්‍රොට්ස්කිගේ ජාත්‍යන්තර වාමාංශික විරුද්ධ පාර්ශ්වයේ සාමාජිකයෙක් විය. ඔහු බොල්ශෙවික්-ලෙනින්වාදයේ සහ ඔක්තෝබර් විප්ලවයේ කදිම සම්ප්‍රදායන් සමග අපව සම්බන්ධ කරන නොබිඳුන හුයක් නියෝජනය කරයි."

## හතර වන ජාත්‍යන්තරයට එදිරිවාදිකම්

ඔහුගේ වාර්තාව දෙස වඩා ලංව බලන්නෙකුට, මාක්ස්වාදී මූලධර්ම ග්‍රාන්ට් විසින් හරියාකාරව ග්‍රහනය කර ගත් කාල පරිච්ඡේදයක් හෝ ට්‍රොට්ස්කිගේ දේශපාලන අරගලයේ සුවිශේෂිත්වය සම්බන්ධව කිසියම් පැහැදිලි අවබෝධයක්, ඔහු තුල හඳුනා ගැනීම වඩාත් දුෂ්කර ය.

ට්‍රොට්ස්කිගේ ලිපිවලින් උකහා ගත හැකි ප්‍රමුඛතම දේශපාලන පාඩම හා ස්ටැලින්වාදී නිලධරයට එරෙහිව ඔහු පවත්වාගෙන ගිය අරගලය ජාත්‍යන්තරවාදයේ වැදගත්කමයි. ග්‍රාන්ට්ගේ දේශපාලන චර්යාව වාම විරුද්ධ පාර්ශ්වයෙන් ආරම්භ වූවා වියහැකි නමුත් ඔහු ඔහුගේ ජීවිතය පුරාවට ම ස්ථිරලෙසට ජාතිකවාදී දෘෂ්ටියේ ගැලී සිටියේ ය. ග්‍රාන්ට් හට, ට්‍රොට්ස්කිගේ දේශපාලන ක්‍රියාමාර්ගය බොහෝ වැඩිදියුනු කම්කරුවන් අතරේ ශ්‍රවනයක් ලබාගැනීමේ මාධ්‍යයක් වූ නමුත් ඊට යටින් දිවෙන ජාත්‍යන්තර ඉදිරිදර්ශනය ඔහු තේරුම් ගත්තේවත් පිලිගත්තේවත් නැත.

ග්‍රාන්ට් 1934 දී දකුනු අප්‍රිකාවේ සිට බ්‍රිතාන්‍යයට සංක්‍රමනය විය. දෙවන ලෝක යුද සමයේදී, ලේබර් පක්ෂය, මහා බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂය සහ එම පක්ෂ සහයෝගීව සිටි වෘත්තීය සමිති යුද ප්‍රයත්නය පවත්වා ගෙන යාම සඳහා වැඩ වර්ජන යට ගැසීමටත් කම්කරුවන්ගේ ඉල්ලීම් යටපත් කිරීමටත් ක්‍රියාත්මක වූ තතු යටතේ, ග්‍රාන්ට් සම්බන්ධ වී සිටි කන්ඩායමට එනම් කම්කරු ජාත්‍යන්තර ලීගයට (ඩබ්ලිව්අයිඑල්) නව සාමාජිකයන් දිනා ගැනීමට හැකියාව ලැබිනි. ඩබ්ලිව්අයිඑල් හතරවන ජාත්‍යන්තරයේ මූලික ලියවිල්ල ප්‍රකාශයට පත් කල අතර ට්‍රොට්ස්කිගේ ම බලපෑම මත ගොඩනැංවුනු ඇමරිකානු සමාජවාදී කම්කරු පක්ෂයේ නිදසුන මත පිහිටමින් එහි මොඩලයක් විය. නමුත් 1938 දී ගොඩනැගුනු හතරවන ජාත්‍යන්තරයට සම්බන්ධවීම, ඩබ්ලිව්අයිඑල් එකහෙලා ම ප්‍රතික්ෂේප කලේ ය.

ග්‍රාන්ට් මේ සම්බන්ධව අතිශය ආඩම්බර විය. " *History of British Trotskyism* (බ්‍රිතාන්‍ය ට්‍රොට්ස්කිවාදයේ ඉතිහාසය) නම් වූ සිය සමරු ග්‍රන්ථයෙහි, හතරවන ජාත්‍යන්තරයේ ආරම්භක සම්මන්ත්‍රනයට සූදානම් වීමට බ්‍රිතාන්‍යයේ ට්‍රොට්ස්කිවාදී කන්ඩායම් එක්සත් විය යුතු යයි යන යෝජනාව ඩබ්ලිව්අයිඑල් සාමාජිකයන් ප්‍රතික්ෂේප කල ආකාරය නැවත සිහිපත් කරයි. "ට්‍රොට්ස්කි සහෝදරයා මෙතෙන්ට පැමිනියත් අපගේ ක්‍රියාපිලිවෙතේ වෙනසක් නොවනු ඇත"යි ඔහු කෑගැසූ අයුරු ග්‍රාන්ට් සිහිපත් කරයි.

ග්‍රාන්ට්ගේ ගෝරනාඩුව ජාතිකවාදයට ඔහුගේ පැවති මුරන්ඩු භක්තියට නිදසුනක් වූ අතර එය ඔහුගේ දේශපාලන සංකේතය බවට පත් විනි. ලේබර් පක්ෂය ක්‍රියාත්මක වනවා ද යන්න පිලිබඳව එකඟ වීමට නොහැකිවීම නිසා අනෙක් කන්ඩායම් සමග එක්සත් වීම ඩබ්ලිව්අයිඑල් ප්‍රතික්ෂේප කලේ ය. ට්‍රොට්ස්කි ඔහුගේ බ්‍රිතාන්‍ය සමචින්තකයන්ට ස්වාධීන ලේබර් පක්ෂයේ සහ පසුව ලේබර් පක්ෂයේ වැඩ කරන්නට උපදෙස් දුන් නමුත් මෙය උපායකට වඩා වැඩි දෙයක් නොවීය. හිට්ලර්ගේ නැගීමට එරෙහිවීමට නොහැකි වීම මගින්, ලෝකය පුරා කම්කරුවන්ගේ අයිතිවාසිකම් පාවාදුන් තුන්වන ජාත්‍යන්තරය විස්ථාපනය කරමින් නව ජාත්‍යන්තරයක් ආරම්භ කිරීමේ මූලික ප්‍රශ්නය අභිභවමින් ප්‍රමුඛතාවය ගත්තා වූ මූලෝපායික මූලධර්මයක් බවට ඩබ්ලිව්අයිඑල් ඉහත කාරනාව ඔසවා තැබුවේ ය.

නව ජාත්‍යන්තරයේ එක්සත් බ්‍රිතාන්‍ය කන්ඩායම තුල ලේබර් පක්ෂයට ඇතුලත් වීම වැනි ප්‍රශ්න සාකච්ඡා කරන්නට හැකියාව තිබෙන්නට ඇත. එහිදී ඔවුහු ජාත්‍යන්තර ඉදිරිදර්ශනය තුල දී තමන්ගේ සුදුසු ස්ථානය අනුමාන කරන්නට ද ඇත. ලෝකයේ පැරනිතම ධනවාදී රාජ්‍යයේ කම්කරු ව්‍යාපාර මතට යෙදවූ අතිවිශාල දේශපාලන බලපෑම හතරවන ජාත්‍යන්තරයට එකතු වීම ඩබ්ලිව්අයිඑල් ප්‍රතික්ෂේප කිරීමෙන් පෙන්නුම් කෙරිනි.

ජාත්‍යන්තරයේ වඩාත්ම මූලික ප්‍රතිපත්ති යටපත්වන තත්වයක් තුල, ට්‍රොට්ස්කි, කන්ඩායම සමග සම්මුතියකට ගෙනයන්නට ඇත. ඔහු ඩබ්ලිව්අයිඑල් සහෝදරවරුන්ට මෙසේ අවවාද කලේ ය.

"ඔවුන්ව ප්‍රතිපත්ති විරහිත කල්ලිවාදී දේශපාලන මාර්ගයකට රැගෙන යමින් පැවතීමෙන්, ඔවුන්ව මඩ ගොහොරුවකට පමනක් ඇද දැමීමට පුලුවන. ඉතාමත් වැදගත් වූ විප්ලවවාදී දේශපාලන කන්ඩායමක් නඩත්තු කිරීම හා වර්ධනය; කල හැකිවන්නේ උදාර ප්‍රතිපත්ති මත පිහිටා කටයුතු කලොත් පමනකි. ජාතික කන්ඩායමකට ස්ථිර විප්ලවවාදී ගමන්මගක් පවත්වා ගත හැකි වන්නේ එය ලෝකය පුරා සිටින සම-චින්තකයන් සමග එක ම සංවිධානයකට දැඩිව බැඳී සිටියහොත් හා ඔවුන් සමග ස්ථිර දේශපාලන සහ න්‍යායික සහයෝගිත්වයක් පවත්වාගෙන යාමෙන්

පමනි. හතරවැනි ජාත්‍යන්තරයම එවැනි සංවිධානයකි. ජාත්‍යන්තර සංවිධානයක පාලනය සහ හික්මීම ප්‍රතික්ෂේප කරන සියලු ම ශුද්ධ වූ ජාතික කන්ඩායම් නියමාකාරයෙන් ම ප්‍රතිගාමීය."[2]

දෙවන ලෝක යුද්ධයෙන් පසුව පෙරී හීලි විසින් මෙහෙයවන ලද ජාත්‍යන්තරවාදී පිලේ උත්සාහයන් තුලින් හා එක්සත් ජනපද සමාජවාදී කම්කරු පක්ෂයේ මැදිහත්වීම උඩ අවසානයේ දී ඩබ්ලිව්අයිඑල් හතරවන ජාත්‍යන්තරයේ එක්සත් බ්‍රිතාන්‍ය කාන්ඩයේ කොටසක් විය. ලෙන්ගතු ලෙෆ්ටිනන්ට්වරයෙකු ලෙස ග්‍රාන්ට් සේවය කල ඩබ්ලිව්අයිඑල් නායක ජොක් හැස්ටන්ගේ ප්‍රබල විරෝධතාවයට එරෙහිව එක්සත් කිරීම සාක්ෂාත් කෙරුනි. එක්සත් කිරීමට පසුව සහ හතරවන ජාත්‍යන්තරයේ බ්‍රිතාන්‍ය කාන්ඩය ලෙසට විප්ලවවාදී කොමියුනිස්ට් පක්ෂය ආර්සීපී නිර්මානය කිරීමේ දී පවා ග්‍රාන්ට් සහ හැස්ටන් ජාත්‍යන්තරයට ගැඹුරින් ම හතුරුකම් කරමින් සිටියහ. හතරවන ජාත්‍යන්තරයේ "නොවෙනස්වන ක්‍රියාමාර්ගය"ට පරිභව කල ඇල්බට් ගෝල්ඩ්මන් සහ ෆීලික්ස් මොරෝ වටා කන්ඩායම් ගතවුන දකුනට පදින විපක්ෂ ප්‍රවනතාව සමග ඔවුහු පෙල ගැසුනහ.[3]

විප්ලවවාදී ව්‍යාපාර ස්ටැලින්වාදීන් විසින් ගෙල සිරකර මරාදමන විට, ග්‍රාන්ට්ගේ අනුගාමිකයෝ, යුද්ධයට පසුකාලීනව සිදු වූ සිදුවීම් හරහා, ට්‍රොට්ස්කිවාදයේ ක්‍රියාමාර්ගය වැරදි සහගත බව ඔප්පු වී ඇතැයි දිගට ම පතුරුවන්නට වූහ. ධනවාදය මුලිනුපුටා නොදැමුන, ස්ටැලින්වාදය සෝවියට් සංගමයේ පාලනය දිගට ම පවත්වා ගෙන යමින් නැගෙනහිර යුරෝපය පුරා එහි පාලනය පුලුල් කර ගැනුනු තතු යටතේ, "සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය තුල ධනවාදය යලි තහවුරු කිරීම හෝ දේශපාලන විප්ලවයක් සහ පැරනි පක්ෂ යටපත් කරන විප්ලවවාදී අර්බුදයක් සහ මහා ට්‍රොට්ස්කිවාදී පක්ෂයක් සෑදීමට මාර්ගය පිලියෙල කිරීම යන්න සාවද්‍ය කෙරේ ය"යි ග්‍රාන්ට් ලීවේය. ට්‍රොට්ස්කිගේ වචනවලින් ම "පැරනි සංවිධානවල එක ගලක් උඩ තවත් ගලක් ඉතිරි නොවනු ඇති අතර හතරවන ජාත්‍යන්තරය පෘථිවිය මත බලය වනු ඇත." නමුත්, යුද්ධයට පසුකාලීනව පැමිනි විප්ලවවාදී තත්වයේ වාසිය ගැනීමට ට්‍රොට්ස්කිවාදීහු ඉතා දුර්වල තත්වයේ සිටියහ. ස්ටැලින්වාදීන් සහ ප්‍රතිසංස්කරනවාදීන් අතට බලය පත් වුනු අතර, ඔවුන් 1918 දී මෙන්, ව්‍යාපාරය පාවා දුන් අතර ධනපතියන් අතට නැවත බලය මාරුවුනි.[4]

විප්ලවවාදීව ධනවාදය පෙරලා දමනු ඇතැයි ද සෝවියට් සංගමයේ දේශපාලන විප්ලවයක් ඇතිවනු ඇතැයි ද ට්‍රොට්ස්කි පොරොන්දු වී තිබේ යයි යන අදහස සහ මුලින්ම වැරදීමකි. සංකීර්න දේශපාලන ක්‍රියාවලියක ප්‍රතිඵලය සම්පූර්න නිරවද්‍යතාවයකින් යුතුව අනුමාන කල හැකි යයි ද මාක්ස්වාදයට විප්ලවය සම්බන්ධ නිවැරදි කාල සටහනක් ඉදිරිපත් කල හැකි යයි ද කිසිම මාක්ස්වාදියෙක් ව්‍යාජ ප්‍රකාශ කරන්නේ නැත. විද්‍යාත්මක මාක්ස්වාදී දේශපාලන විශ්ලේෂනයේ ලක්ෂන කිසි දා හඳුනා නොගත් ග්‍රාන්ට් හා අනෙකුත් බොහෝ දෙනා, ඒ බව පෙන්නුම් කරමින්, ට්‍රොට්ස්කි ඔවුන්ව නොමග යැවුවේ යැයි පැහැදිලිව ම විශ්වාස කලෝ ය.[5]

ඔහුගේ අනුගාමිකයන්ට අනුව, ස්ටැලින්වාදයේ ව්‍යාප්තිය සහ අධිරාජ්‍යවාදී ස්ථායීකරනය වැනි නව දේශපාලන යථාර්ථය ගැන විශ්ලේෂනයක් වර්ධනය කිරීමට ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය තුල හැකියාව තිබූ පුද්ගලයා ග්‍රාන්ට්ය. විප්ලවවාදී කොමියුනිස්ට් පක්ෂයේ (ආර්සීපී) නායකත්වය මෙහි දී හුදකලාව සිටියා නො වේ. 1939 තරම් ඈතදී ම ජොන්සන් ෆොරස්ට් ප්‍රවනතාවය මෙන්ම, මැක්ස් ෂැට්මන් සහ ජේම්ස් බර්න්හැම් සෝවියට් සංගමය සම්බන්ධව ට්‍රොට්ස්කිගේ විශ්ලේෂනයට විරුද්ධ විය. ගෝල්ඩ්මන් සහ මොරෝ පසුකාලීනව විපක්ෂය ලෙස මතු විය. එවකට හතරවන ජාත්‍යන්තරයේ නායකයන් දෙපලක වූ මයිකල් පැබ්ලෝ සහ අර්නස්ට් මැන්ඩල්, මුලදී මෙම ප්‍රවනතාවයට විරුද්ධවුව ද පසුව ස්ටැලින්වාදී නිලධරයට ප්‍රගතිශීලී භූමිකාවක් රඟ දක්වන්නට හැකි බවත් සමාජය විප්ලවවාදී පරිවර්තනයකට ලක් නොකොට මිලිටරි බලයන් සහ ජනසතු කිරීම් මගින් නිලධාරිවාදය තුලින් වැඩ කරන ජනතාවගේ රජයන් ගොඩනැගිය හැකි බවට වාද කරන්නට පටන් ගත්හ.

ග්‍රාන්ට්ගේ කැපී පෙනීම වන්නේ දකුනට හැරීමේ දී ඔහු තනිවූ නිසා නොව, පශ්චාත් යුද කාලීන සමයේ එවැන්නවුන් අතුරින් ඔහු ප්‍රමුඛයෙකු වීමයි. ආර්සීපීහි ග්‍රාන්ට්ගේ සම-චින්තක ජිම් ඩීන්, 1950 ජූනියේ දී ග්‍රාන්ට්ට ලියන විට, ඔවුන්ගේ අදහස් සහ පැබ්ලෝගේ අදහස් අතර අනන්‍යතාවය පිලිගත්තේ ය. "පැබ්ලෝ සංක්‍රමනය සිදු කර ඇත! කෙතරම් නම් වර්ධනයක් ද, ඔහු අපට එරෙහිව අරගල කරනවා." ඩීන් චෝදනා කලේ ය. "ඒත් දැන් අපේ තත්වයට ම අඩු වැඩි වසයෙන් පැමිනිලා. නැගෙනහිර යුරෝපය පුරා වැඩ කරන ජනතාවගේ රාජ්‍ය ඇති බවට ඔහු වැඩි කල් නොගොස් ම වාද කරනු ඇති."[6]

යටත් විජිත සහ අර්ධ යටත්විජිත රාජ්‍යයන් තුල අරගල වැඩි වන විට, වැඩ කරන ජනතාවගේ සවිඥානික සහභාගිත්වය, මාක්ස්වාදී පක්ෂයක් පැවතීම, පවතින රාජ්‍යය සහ දේපල සම්බන්ධතා විප්ලවවාදීව මුලිනුපුටා දැමීම ආදියෙන් තොරව සුලු ධනේශ්වර ජාතික ව්‍යාපාරවලට එම රටවල කම්කරු රාජ්‍ය ඇති කල හැකි යයි පැබ්ලෝ සහ මැන්ඩල් සඳහන් කලෝ ය. ඇල්ජීරියාවේ බෙන්බෙලා සහ කියුබාවේ කැස්ත්‍රෝ වැනි ජාතිකවාදී නායකත්වයන්ට උපදේශකවරුන්

ලෙස ක්‍රියා කිරීම මාක්ස්වාදීන්ගේ භූමිකාව වන බැවින් මෙම රටවල විප්ලවවාදී පක්ෂ ගොඩනැගීමේ අවශ්‍යතාවක් පැන නොනගී.

1953 දී, එක්සත් ජනපදයේ සමාජවාදී කම්කරු පක්ෂයේ නායක ජේම්ස් කැනන්, විවෘත ලිපියක් ලියමින්, පැබ්ලෝවාදයට එරෙහි සටනේදී මතුවන මූලික දේශපාලන ප්‍රශ්න ලුහුඬින් දැක්වී ය. කැනන් මෙසේ ලිවී ය. "පැබ්ලෝ වටා සංකේන්ද්‍රනය වූ මෙම කන්ඩායම දැන් දැනුවත් ව සිතාමතා ම ක්‍රියා කරනුයේ, විවිධ රටවල පවතින ට්‍රොට්ස්කිවාදයේ ඓතිහාසික ව නිර්මිත කේඩරයන් කඩාකප්පල් කොට, භේද භින්න කොට, විසුරුවා හැර, හතරවන ජාත්‍යන්තරය දිය කර හැරීමට ය."[7]

හතරවන ජාත්‍යන්තරය ආරම්භ කරන්නට යෙදුනු මූලික පරමාර්ථ කැනන් නැවත පිහිටුවීමත් ඔහුගේ විවෘත ලිපියත්, එම පරමාර්ථ පිලිපදින සහ පැබ්ලෝගේ දියකරහැරීම්වාදයට සහ ස්ටැලින්වාදයට කොන්දේසි විරහිත යටත් වීම ප්‍රතික්ෂේප කල අයගේ එකමුතු වීමේ කේන්ද්‍රස්ථානය බවට පත් විය. එම වසර අවසානයේ දී, කැනන්ගේ විවෘත ලිපිය සමග තම සාමූහිකත්වය තහවුරු කිරීමේ යෝජනාව පදනම වසයෙන් ගෙන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ඇති කර ගැනින.

විවෘත ලිපිය හා එකඟ වූ සියල්ලන් ම නෙරපා හරිමින් පැබ්ලෝ එයට ප්‍රතිචාර දැක්වී ය. බ්‍රිතාන්‍ය තුල පැබ්ලෝගේ නියෝජිත, ජෝන් ලෝරන්ස් එහි තර්කානුකූල නිගමනය කරා තම මාර්ගය ගනිමින් කොමියුනිස්ට් පක්ෂයට බැඳුනු විට, එක්සත් රාජධානිය තුල සංවිධානයක් නොමැතිව පැබ්ලෝ තනි විය. ග්‍රාන්ට් එම අවස්ථාව උපයෝගි කොට ගෙන පැබ්ලෝ සමග එක් වී එක්සත් ලේකම් මන්ඩලය නමින් සංවිධානයක් පිහිටුවා ගත්තේ ය. ග්‍රාන්ට්ගේ සංගෘහිත කෘති දිගුකාලීනව ගැඹුරින් සොයා බලන්නෙකුට විවෘත ලිපිය හා සම්බන්ධ කිසිදු නිර්දේශයක් හමු නොවනු ඇත. පැබ්ලෝ සමග සම්බන්ධ වෙමින් ක්‍රියාකාරීත්වය හරහා ඔහු එයට පිලිතුරු සැපයුවේ නමුදු, කම්කරු පන්ති ජාත්‍යන්තරවාදී මූලධර්ම සම්බන්ධ මෙම ඓතිහාසික ප්‍රකාශනයට කිසිදු ප්‍රතිචාරයක් දැක්වීමට බැඳී සිටින බවට ඔහුට කවදාවත් දැනුනේ නැත.

ග්‍රාන්ට් 1964 දී, පැබ්ලෝවාදී එක්සත් ලේකම් මන්ඩලයෙන් කැඩී වෙන් විය. නමුත් සියලු අත්‍යවශ්‍ය අවස්ථාවන්හි දී ඔහුගේ දේශපාලන ඉදිරි දර්ශනය පැබ්ලෝ සහ මැන්ඩල් සමග සමපාතව පැවතුනි. ග්‍රාන්ට්ගේ දේශපාලනය පැබ්ලෝ රහිත පැබ්ලෝවාදය ලෙසට ගුනාංගිකරනය කල හැකි ය. ඔහුගේ කන්ඩායම, කියුබානු කමිටුව සඳහා "පැබ්ලෝවාදී සාධාරනත්වය" අනුකරනය කරමින් චාවේස්හට සහයෝගය දක්වන ව්‍යාපාරයේ මුහුනත ලෙසට "වැනිසියුලාවට අත නොතබනු" නමින් සංවිධානයක් ඇති කර ගත්තේ ය.

## මතු සම්බන්ධයි

### සටහන්:

1. **බලන්න** http://www.wsws.org/articles/2006/mar2006/van2-m20.shtml.

2. *Documents of the Fourth International* (හතරවන ජාත්‍යන්තරයේ ලේඛන), **නිව් යෝක්: පාත්ෆයින්ඩර් ප්‍රෙස්, 1973, පි. 270.**

3. සමාජවාදී කම්කරු පක්ෂයේ අභ්‍යන්තර නිවේදන පත්‍රිකාව, **වෙළුම 8, නො. 8, ජුලි 1946, පිටු 28-29; උපුටා දැක්වීම ඩේවිඩ් නෝර්ත්,** *අප රක්නා උරුමය: හතරවන ජාත්‍යන්තරයේ ඉතිහාසයට කෙරෙන එකතු කිරීමක්,* **ප්‍රථම භාගය, කම්කරු මාවත ප්‍රකාශන, 1990, පිටු 135-136.**

4. **ටෙඩ් ග්‍රාන්ට්** *A History of British Trotskyism* (බ්‍රිතාන්‍ය ට්‍රොට්ස්කිවාදයේ ඉතිහාසයක්), **හැඳින්වීමග** www.marxist.com/hbt/

5. **බලන්න** http://www.wsws.org/articles/2005/sep2005/le41-s14.shtml.

6. **ඩීන්ගෙන් ග්‍රාන්ට් වෙත ලිපියක්, ජිමී ඩීන් ලේඛනාගාරය 24 ජූනි 1950.**

7. **උපුටා දැක්වීම** *අප රක්නා උරුමය,* *ද්විතීය භාගය,* **කම්කරු මාවත ප්‍රකාශන, 1993, පිටු 316.**